
# මහනුවර රාජධානිය

# 10 ශ්‍රේණිය

## 08 පාඩම



රූපය 2.1 පැරණි මහනුවර නගරය

නිපුණතාව : ශ්‍රී ලාංකික රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය අගයයි.

නිපුණතා මට්ටම : මහනුවර රාජධානියේ ආරම්භය සහ ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු විමසා බලයි.

**සැකසුම : යූ. සුමිත්‍රා උඩුවරගේ**

**කෑ/දෙහි/ අංහෙට්ටිගම මහ විද්‍යාලය**

**අංහෙට්ටිගම.**

## 1. ආරම්භය හා ව්‍යාප්තිය

සෙංකඩගල, කන්දේ නුවර, උඩරට රාජධානිය, මහනුවර රාජධානිය ලෙස හඳුන්වයි.

- සේනා සම්මත වික්‍රමබාහු උඩරට ස්වාධීන රාජධානියක් ගොඩනගන ලද මුල්ම රජතුමාය. පසුව ඔහුගේ පුත් ජයවීර බණ්ඩාර රජවිය. ඉන් පසු කරලියැද්දේ බණ්ඩාර රජවිය. ඔහු පෘතුගීසීන්ට හිතවත් රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කළේය.

- වීර සුන්දර බණ්ඩාර I රාජසිංහ රජුට උඩරට ආක්‍රමණයට උදව් කළේය. එම ආක්‍රමණයට මුහුණ දිය නොහැකිව කරලියැද්දේ බණ්ඩාර තම දියණිය සහ බෑණා සමග පෘතුගීසීන් වෙත පැන ගියේය. ඉන් අනතුරුව කුසුමාසන දේවිය දෝන කතරිනා නමින්ද, යමසිංහ බණ්ඩාර දොන් පිලිප් නමින්ද බෞතීස්ම ලැබීය.

- ක්‍රි.ව. 1580 දී පමණ වීරසුන්දර බණ්ඩාරගේ ක්‍රියා කළාපය පිළිබඳ සැක සිතූ I රාජසිංහ රජු උපායශීලීව ඔහු මරණයට පත් කළහ. ඔහුගේ පුතා කොනප්පු බණ්ඩාර පෘතුගීසීන් වෙත පලා ගියේය. කොනප්පු බණ්ඩාර අවුස්ත්‍රියාවේ දොන් ජුවාන් නමින් බෞතීස්ම ලැබුවේය.

- පසු කාලීනව පෘතුගීසීන් තමන් භාරයේ සිටි යමසිංහ බණ්ඩාරව උඩරටට යවා උඩරට ඇතැම් ප්‍රභූන්ගේද සහයෙන් පාලනයක් පිහිටුවිය. මොහු පෘතුගීසී ගැති රූකඩ පාලකයෙකු විය. කෙටි කලකින් ඔහු මිය ගියේය. ඔහුගේ කුඩා පුතු සිංහාසනයට පත්කර පෘතුගීසීන් බලය ගෙනයාමට උත්සහ කළත් කොනප්පු බණ්ඩාර නිසා එය අසාර්ථක විය. ඉන් අනතුරුව උඩරට කොනප්පු බණ්ඩාර I විමලධර්මසූරිය නමින් රජවිය.

## උඩරට සිංහල රජවරු කළ සේවය

| රජතුමා | මුහුණ දුන් අභියෝග | දේශපාලන, ආර්ථික, ආගමික, සංස්කෘතික සේවය | සටන් මෙහෙයවීම |
|---|---|---|---|
| I විමලධර්මසූරිය රජු<br>1592 - 1604 | • නීත්‍යානුකූල රාජ්‍ය උරුමය නොවීම.<br>• උඩරට රාජධානිය පෘතුගීසීන්ගෙන් මුදා ගැනීම.<br>• බුදු සසුන නගා සිටුවීම.<br>• ආර්ථික කටයුතු දියුණු කිරීම. | • කුසුමාසන දේවිය විවාහ කර ගෙන රාජ්‍යත්වය තහවුරු කර ගැනීම.<br>• කතෝලික ආගම අතහැර බෞද්ධ ආගම වැළඳගැනීම.<br>• බෞද්ධ නාමයක් ලබා ගැනීම.<br>• සබරගමුව පළාතේ දෙල්ගමු විහාරයේ තැන්පත් කර තිබූ දන්ත ධාතුව වැඩම කරවා දළදා මාළිගාවේ තැන්පත් කිරීම.<br>• ක්‍රි.ව 1594 දන්තුරේ සටනින් පෘතුගීසි පරාජය කිරීම.<br>• පෘතුගීසීන්ට එරෙහි පහතරට ඇති වූ කැරළි වලට උදව්දීම.<br>• පෘතුගීසි පළවා හැරීමට ලන්දේසි සහය ලබා ගැනීමට උත්සහ කිරීම.<br>• බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම.<br>• ලංකා තිලකය, රිදී විහාරය, ගඩලාදෙණිය, පැරණි වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය,<br>• ගොවිතැන් කිරීම, කපු වගාව දියුණු කිරීමට අනුබල දීම, යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම, උඩරට ආශ්‍රිත වෙඩි ලුණු කර්මාන්තය දියුණු කිරීම.<br>• ක්‍රි.ව. 1604 දී මරණයට පත්විය. | ක්‍රි.ව. 1594 දන්තුරේ සටනින් ජයග්‍රහණය ලබා ගැනීම. |
| සෙනරත් රජු<br>1604 - 1635 | • රාජ්‍ය උරුමය නොමැතිවීම.<br>• පෘතුගීසීන්ගෙන් එල්ල වූ බලපෑම | • කුසුමාසන දේවිය විවාහ කර ගෙන රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීම.<br>• රාජ්‍යය කොටස් තුනකට බෙදා පුතුන්ට පැවරීම.<br>ඌව - කුමාරසිංහ කුමරු , මාතලේ - විජේපාල කුමරු,<br>මහනුවර - රාජසිංහ කුමරු | (මහා අස්ථාන කුමරු )<br>II රාජසිංහ කුමරුගේ මූලිකත්වයෙන් 1630 ඌව රන්දෙණිවෙල සටන ජයග්‍රහණය කිරීම |

# සිංහල රජවරු කළ සේවය

| රජතුමා | මුහුණ දුන් අභියෝග | දේශපාලන, ආර්ථික, ආගමික, සංස්කෘතික සේවය | සටන් මෙහෙයවීම |
|---|---|---|---|
| II රාජසිංහ රජු (මහා අස්ථාන කුමරු ) 1635 - 1687 | • පෘතුගීසීන් උඩරටට එල්ල කළ ප්‍රහාර මැඩ පැවැත්වීම.<br>• පෘතුගීසීන් මෙරටින් පළවා හැරීම.<br>• රදල ප්‍රධානීන්ගේ තර්ජන අවම කර ගැනීම.<br>• ලන්දේසීන්ගෙන් උඩරට නිදහස් කර ගැනීම. | • පෘතුගීසී පලවා හැරීමට ලන්දේසීන්ගෙන් උදව් ගැනීම.<br>• ලන්දේසි උඩරට අල්වා ගැනීමට උත්සහ කිරීම, ක්‍රි.ව. 1638 ලන්දේසි සහය ලබාගෙන ක්‍රි.ව. 1658 දී පෘතුගීසීන් මෙරටින් පළවා හැරීම.<br>• ක්‍රි.ව. 1670 - ක්‍රි.ව. 1675 දී ලන්දේසීන්ට ප්‍රබල ප්‍රහාරයක් එල්ල කර ප්‍රදේශ රැසක් අල්ලා ගැනීම.<br>• කල්පිටිය, හලාවත, ත්‍රිකුණාමලය, මඩකලපු වරායන් උඩරට සතුවිය.<br>• පෘතුගීසීන් පලවා හැරීමට ලන්දේසි සහය ගත් නිසා, ඉඟුරු දී මිරිස් ගත්තා වැනි ප්‍රස්තා පිරුළ පට බැඳිණ. | 1638 ගන්නෝරුව සටන ජයග්‍රහණය ලැබීම. |
| II විමලධර්මසූරිය රජු 1687- 1707 | • රදල බලය වර්ධනය විය. | • ලන්දේසීන් සමග සාමකාමීව කටයුතු කළහ.<br>• බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒම.<br>• දළඳා මාළිගාව ප්‍රතිසංස්කරණය කිරීම. | |
| ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු 1707 - 1739 (මොහු සිංහලයේ අවසාන සිංහල රජතුමාය.) | • දුර්වල පාලකයෙකි. ප්‍රභු බලය වර්ධනය විය | • දකුණු ඉන්දීය කුමාරිකාවක් විවාහ කර ගැනීම. රජුට දරුවන් නොමැති නිසා දකුණු ඉන්දියානු සම්ප්‍රදායට අනුව බිසවගේ සහෝදරයාට රජකම හිමිවිය. | |

# නායක්කර් රාජවංශය

වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා උරුමකරුවෙකු නොතබාම මිය ගියේය. එහිදී දකුණු ඉන්දියානු සම්ප්‍රදායට අනුව ඔහුගේ බිසවගේ සහෝදරයාට රජකම හිමිවේ. මෙලෙස ඇරඹි රාජවංශය නායක්කර් රාජ වංශය ලෙස හැඳින්වේ.

| රජතුමා | දේශපාලන, ආර්ථික, ආගමික, සංස්කෘතික සේවය |
|---|---|
| ශ්‍රී විජය රාජසිංහ රජු<br>ක්‍රි.ව. 1739 - 1747 | • නව රාජවංශයකි. උඩරට රදල බලය මැඩලීමට ඔහුගේ ඥාතීන්ට තනතුරු දුන්හ.<br>• බුරුමයෙන් උපසම්පදාව ගෙන ඒමට උත්සහ කළත් අසාර්ථක විය. මොහු බුදු දහම වැළඳගත්හ. රාජ්‍ය උරුමයට දරුවන් නැති නිසා ඔහුගේ බිසවගේ සොයුරුට රජකම හිමිවිය. නායක්කර් වංශයේ ප්‍රථම රජුය. |
| කීර්ති ශ්‍රී රාජසිංහ රජු<br>ක්‍රි.ව. 1747 - 1781 | • වයස අවුරුදු 16 දී රජවිය. ඔහුගේ පියාවන නරේනප්පා නායක්කර් පාලනයට ඇඟිලි ගැසීය.<br>• සියම් දේශයෙන් උපාලි හිමි වැඩම කරවා උපසම්පදාව ඇති කළහ. (වර්තමාන සියම් නිකාය)<br>• උඩරට හා පහතරට විහාරාරාම ප්‍රතිසංස්කරණය<br>• සරණංකර හිමිට සංඝරාජ තනතුර පිරි නමා ආගමික ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කිරීම.<br>• 1766 ලන්දේසි සමඟ සාම ගිවිසුම අත්සන් කිරීම.<br>• රජකමට උරුමකරුවෙකු නොවීම. |
| රාජාධි රාජසිංහ රජු<br>ක්‍රි.ව. 1781 - 1798 | • රදල ප්‍රභූන් හා නායක්කර් වංශික රජවරු අතර මතභේද වර්ධනය විය.<br>• ක්‍රි.ව. 1796 දී ඉංග්‍රීසීන් මුහුදු බඩ ප්‍රදේශ අල්වා ගත්හ. |
| ශ්‍රී වික්‍රම රාජසිංහ රජු<br>ක්‍රි.ව. 1798 - 1815 | • කන්නසාමි කුමරා - ශ්‍රී වික්‍රම රාජසිංහ ලෙස රජවිය.<br>• 1803 උඩරට ඉංග්‍රීසි ආක්‍රමණය මැඩලීය.<br>• උඩරට මහජනයා හා රජු අතර සබඳතා බිඳ වැටුණි.<br>• 1815 පෙබරවාරි උඩරට රාජධානිය ඉංග්‍රීසීන්ට යටත් විය. (උඩරට ගිවිසුම මගින් රජු වෙල්ලෝරයට පිටුවහල් කළා.) මොහු අත්අඩංගුවට ගත්තා. ශ්‍රී ලංකාවේ අවසාන රජතුමාය. |

## ඇගයීම.

- **පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

01. මහනුවර රාජධානිය හඳුන්වන නම් 03 ක් ලියන්න.

02. උඩරට රාජධානියේ ආරම්භක පාලකයා නම් කරන්න.

03. උඩරට ආක්‍රමණයට මුහුණ දීමට නොහැකි වූ කරලියැද්දේ බණ්ඩාර ගත් ඉදිරි ක්‍රියාමාර්ග දක්වන්න.

04. පෘතුගීසීන්ගේ බෞතිස්ම ලැබුණ පසු, කුසුමාසන දේවිය, යමසිංහ බණ්ඩාර සහ කොනප්පු බණ්ඩාර ලැබූ කතෝලික නාමයන් පිළිවෙලින් සඳහන් කරන්න.

05. කොනප්පු බණ්ඩාර රජවූයේ කුමන නමකින්ද?

06. I විමලධර්මසූරිය රජු මුහුණ දුන් අභියෝග 03 ක් ලියන්න.

07. I විමලධර්ම සූරිය රජු උඩරට සිය නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට ගත් ක්‍රියාමාර්ග ලියන්න.

08. සෙනරත් රජු රජවූයේ කිනම් වර්ෂයේදීය.

09. සෙනරත් රජතුමා කුමාරවරුන් තිදෙනාට රාජ්‍ය බෙදා දුන් අයුරු ලියන්න.

10. පහත පින්තූරය අධ්‍යයනය කර ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.



i. මොහු කවුරුන්ද?

ii. මොහුගේ කුඩා කාලයේ නම කුමක්ද?

iii. මොහු ජයගත් සටන් 02 ක් සඳහන් කරන්න.

iv. මොහුට පටබැඳුණු විරුදාවලිය කුමක්ද?

11. II රාජසිංහ රජු පෘතුගීසීන් මෙරටින් පලවා හැරි වර්ෂය කුමක්ද?

12. දෙවන රාජසිංහ රජුගේ කාලයේදී උඩරටට නතු කරගත් වරායන් 04 ක් ලියන්න.

13. II විමලධර්මසූරිය රජු දක්ෂ පාලකයෙකු නොවූවත් ඔහු බුද්ධ ශාසනයට සිදු කළ ආගමික මෙහෙවර දක්වන්න.

14. නායක්කර් වංශය යනු කුමක්ද?

15. නායක්කර් වංශය ඇති වූ අයුරු කෙටියෙන් විස්තර කරන්න.

16. නායක්කර් වංශික රජවරු නම් කරන්න.

17. අවසාන සිංහල රජු නම් කරන්න.

18. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීමට අනුගමනය කළ ක්‍රියා මාර්ග 02 ක් ලියන්න.

19. ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් රජවූයේ කවුරුන්ද?

20. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුව ඉංග්‍රීසිහු අත් අඩංගුවට ගත් වර්ෂය කුමක්ද?

21. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුව පිටුවහල් කළ ස්ථානය නම් කරන්න.

## ❖ පරිපාලන සංවිධානය

ඉහළම බලතල රජු සතුය. සභයට අධිකාරම්වරු දෙදෙනෙකු සිටි අතර දේශපාලන වශයෙන් ඔවුන් දෙවෙනි වූයේ රජතුමාට පමණි. රාජ්‍යයේ වැදගත් කටයුතු සාකච්ඡාවට රාජ සභාවක් විය. මෙම රාජ සභාවට අධිකාරම්වරු, දිසාවේවරු, මහලේකම්, ඒ ඒ බද්දෙ ලේකම්ලා සහභාගී විය.

**<u>රජුගේ බලතල</u>**

- රටේ ඉහළම බලය හිමි තැනැත්තා රජතුමාය.
- රටේ සාමය පවත්වාගෙන යාම හා ආරක්ෂාව සැලසීම රජුගේ ප්‍රධාන කාර්යන් වේ.
- සම්ප්‍රදාය හා පෙර සිරිතට අනුව රජු කටයුතු කළ යුතු විය.
- රටේ ඉහළම අධිකරණය රජු වූ අතර වැරදි කරුවෙකුට මරණීය දණ්ඩනය පැනවීමේ බලය රජුට තිබුණි.
- රටේ සියලු දේශපාලන කටයුතු, ආර්ථික කටයුතු හා පරිපාලන කටයුතු රජුගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක විය.

**<u>අධිකාරම්වරු</u>**

| මහ අධිකාරම් | දෙවන අධිකාරම් |
|---|---|
| හත් කෝරලේ | හතර කෝරලය |
| ඌව | තුන් කෝරලය |
| මාතලේ | සබරගමුව |
| වලපනේ | ඌව පළාත |
| බින්තැන්න | උඩු නුවර, යටිනුවර, තුම්පනේ |
| නුවර කලාවිය | කොත්මලේ, බුලත්ගම |

- **මාළිගාව සතු නිළධාරීන්**

  ගජනායක නිලමේ, මහ ලේකම්, මහ ගබඩා නිලමේ, දියවඩන නිලමේ, හළු වඩන නිලමේ, බත් වඩන නිලමේ,

- **රට වසම**

  රට = 9 + දිසාවෙනි = 12 = 21

  රට භාර නිලධාරීන්, රටේ මහත්වරුන්

  ඔහු යටතේ ලියනරාල, උණ්ඩිය රාල, දිසාවේ - දිසාව

  කෝරළේ - කෝරාල - මුහන්දිරම් - ගම්භාරව විදානේවරු

- **බද්දේ සංවිධානය**

දේශපාලන වශයෙන් පැවති ප්‍රාදේශීය සංවිධාන ජාලයට අමතරව දිසාව තුළ සිටි ශිල්පීන් හෝ කුල ඔවුන්ගේ කාර්යය අනුව වෙනම සංවිධානය කොට තිබිණි. මුල් කාලයේ බද්දෙ සංවිධානය වෙනම ක්‍රියාත්මක වුවත්, උඩරට රාජ්‍යයේ අවසාන කාලයේ එය දිසාව යටතේ ක්‍රියාත්මක විය.

- මඩිගේ බද්ද (ප්‍රවාහන කටයුතු)
- කුරුවෙ බද්ද (ඇතුන් ඇල්ලීම)
- බඩහැල බද්ද (වළං තැනීම)
- රදා බද්ද (රෙදි සේදීම)
- හැඳ බද්ද (රෙදි විවීම)

**විහාර දේවාල පාලන කටයුතු**

විහාරාරාම පාලන කටයුතු, මහ නායක හා අනුනායක හිමිවරුන්ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක විය. දළඳා මාලිගාවේ කටයුතු දියවඩන නිළමේ තුමා මඟින් ක්‍රියාත්මක කෙරිණ. විහාර දේවාල නඩත්තුව, පුද පූජා සංවිධානය සහ පෙරහැර කටයුතුවලට ගම්වර ලැබූ රාජකාරි ශ්‍රමය සැපයූ පිරිසක් සිටියහ.

**<u>අධිකරණ කටයුතු</u>**

ඉහළම අධිකරණ බලතල රජු සතුය. සෑම නිලධාරියෙකුටම තම පදවිය අනුව අධිකරණ බලතල හිමිවිය. ඇතැම් නඩු ඇසීමේ බලය වූයේ රජුට පමණි.

**<u>රජතුමා විසින් විසඳන ලද නඩු වර්ග</u>**

- වැදගත් නායකයින් සම්බන්ධ නඩු
- කැරලි කෝලාහල පිළිබඳ නඩු
- කුමන්ත්‍රණ නඩු
- රාජද්‍රෝහීත්වය පිළිබඳ නඩු
- විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු

**<u>එකල වැරදිකරුවන්ට ලබා දුන් දඬුවම්</u>**

- උල තැබීම
- අතුල් පහර දීම
- දඬු කඳේ ගැසීම
- ඇතුන් ලවා පාගා මැරීම
- කස පහර දීම.
- දඟ ගෙයි ලෑම.
- පිටුවහල් කිරීම
- දියේ ගිල්වා මැරීම.
- රොඩී රැහැට දැමීම.
- හිස කෙස් කැපීම.

## ආර්ථික ක්‍රමය

- කෘෂිකාර්මික ආර්ථික ක්‍රමයක් පැවතිණ.
- පරිභෝජනය සඳහා විය.
- ස්වයංපෝෂිත ආර්ථික රටාවකි.
- කඳුකර බව නිසා ගොවිබිම් සීමිත විය.
- හෙල්මළු වගාවද දක්නට ලැබීය.
- හේන් වගාව දක්නට ලැබිණ.
- රජරට, රුහුණු රට වැව් මේ කාලය වන විට පරිහානියට පත් වී තිබිණ.
- ගෙවතු වගාව දක්නට ලැබිණ.
- යකඩ වැඩ කර්මාන්තය, ලෝහ කර්මාන්තය, ලාක්ෂා කර්මාන්තය දියුණු තත්ත්වයක පැවතිණ.
- පන් කර්මාන්තය දියුණු තත්ත්වයක පැවතිණ.
- කුරක්කන්, අමු, මෙනේරි, ඉරිඟු, ධාන්‍ය වර්ග, අල බතල වගා කළහ.
- ගෙවතු ආශ්‍රිතව කොස්, දෙල්, ගම්මිරිස්, සාදික්කා, කරදමුංගු, පුවක්, එළවළු, පළතුරු වගා කළහ.
- සත්ත්ව පාලන කටයුතු ද සිදු විය.

## සමාජ සංවිධාන

- ඉඩම් වල උරුමය රජු සතු විය.
- ඉඩම් අයිතිය, භුක්තිය මත කොටස් විය. ගබඩාගම්, නින්දගම්, විහාර ගම්, දේවාල ගම්, පරවේණි ගම් වශයෙන් ජනයා ඉඩම් භුක්තිය හිමි විය.
- රට වැසියන්ගේ සේවා ක්‍රමය රාජකාරිය නමින් හැඳින්වීය.
- ගම ස්වයංපෝෂිත විය. සමාජය කුල ක්‍රමය මත පදනම් විය.
- විවාහය දීග, බින්න, එක ගෙයි කෑම ලෙස ක්‍රම තුනකි.
- මනමාලිය මනමාලයාගේ නිවසට විවාහයෙන් පසු පදිංචියට යාම දීග විවාහයයි.
- මනමාලයා මනමාලියගේ නිවසේ පදිංචි වීම බින්න විවාහයයි.
- පවුලේ සහෝදරවරු දෙදෙනෙක් එක බිරිඳක විවාහ කර ගැනීම එකගෙයි කෑම විවාහයයි.
- කුල සිරිත්, විරිත් හා සම්ප්‍රදායන් වලට මුල් තැන ලැබිණ. පවුල ප්‍රධාන සමාජ ඒකකය විය.
- උඩරට ගැමි සමාජයේ සියලු කටයුතු අත්තම් ක්‍රමයට අනුව සිදුවිය.
- ගුණ ගරුක බව සමාජයේ ප්‍රකට ලක්ෂණයක් විය.
- පන්සල ගැමි දිවිය හා බැඳුණු මධ්‍යස්ථානය විය.

**ඇගයීම**

01. පහත සඳහන් වන්නේ මහ අධිකාරම් සහ දෙවන අධිකාරම් යටතේ පරිපාලනය වූ ප්‍රදේශයන්ය. දී ඇති හිස්තැන්හි අදාල ප්‍රදේශ ලියා දක්වන්න.

| මහ අදිකාරම් | දෙවන අදිකාරම් |
|---|---|
| හත් කොරලේ<br>අ. ....................................<br>වලපනේ<br>ආ. ....................................<br>....................................<br>ඇ. .................................... | හතර කෝරලය<br>ඈ. ....................................<br>සබරගමුව<br>ඉ. ....................................<br>උඩු නුවර, යටිනුවර, තුම්පනේ<br>ඊ. .................................... |

02. පහත සඳහන් බදු වර්ග නම් කරන්න.

I. කුරුවේ බද්ද

II. මඩිගේ බද්ද

III. බඩහැල බද්ද

IV. රදා බද්ද

V. හැඳ බද්ද

03. මහනුවර රාජධානියේ වැරදිකරුවන්ට ලබා දුන් දඬුවම් 10ක් ලියා දක්වන්න.

04. උඩරට රාජධානියේ ස්වයංපෝෂිත ආර්ථික රටාවන් හා සබැඳි සමාජ සංවිධාන රටාවක් විය. එම ආර්ථිකය හා සමාජ සංවිධාන පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

05. මහනුවර රාජධානියේ පාලකයෝ කිහිපදෙනෙක් දැක්වේ. ඔවුන්ගේ පාලන කාලයන් ලියා දක්වන්න.

I. විමලධර්මසූරිය රජු

II. රාජාධිරාජසිංහ රජු

III. ශ්‍රී වික්‍රමරාජසිංහ රජු

06. මහනුවර රාජධානියේ විවාහ ක්‍රම තුන දක්වා ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

07. කඳුකර ප්‍රදේශයන්හි වගා කළ බෝග වර්ග 4ක් නම් කරන්න.